# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/54 - 2022 නොවැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021 (II)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 41(7) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 71 වන වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

**1.** මෙම නියෝග 2022 අංක 1 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

*ලියාපදිංචි කිරීම*

**2.** 2022 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 2299/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, 2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝග යටතේ ප්‍රතිපත්තිමය


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වශයෙන් අනුමැතිය ලබාදීමේ ලිපියක් නිකුත් කරනු ලැබ ඇති සහ කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචිවීමට අපේක්ෂා කරන සමාගමක්, (මේ නියෝගවල "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 41(3) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි, ලේඛන, ප්‍රකාශ, තොරතුරු සහ ආපසු ගෙවනු නොලබන පිරිසැකසුම් කිරීමේ ගාස්තුව සමඟ මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති I වන ආකෘති පත්‍රයට සාරානුකූල වූ ඉල්ලුම්පත්‍රයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

**3.** ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් පසුව, කොමිෂන් සභාවට එම ඉල්ලුම්පත්‍රය සහ ලේඛන පිළිගත හැකි නම්, කොමිෂන් සභාව විසින්, ඒ සමාගම සමාගම් පනතේ XI වන කොටස ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට සහ කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසරය ඇති අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කාර සමාගමට නිකුත් කිරීමට කටයුතු කරන ලෙසට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නිර්දේශ කළ යුතුය.

**4.** (1)සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් එම සමාගම කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසරය ඇති අක්වෙරළ සමාගමක් ලෙස දින තුනක් ඇතුළත ලියාපදිංචි කිරීමට අවශ්‍ය සියලු පියවර ගෙන, ඒ ඉල්ලුම්කාර සමාගම වෙත නිකුත් කරනු ලැබීම පිණිස, මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති II වන ආකෘති පත්‍රයට සාරානුකූල වූ, එම සමාගම නමින් වන ලියාපදිංචි කිරීමේ සහතිකයක් කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය.

(2) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් (මේ නියෝගවල "රෙජිස්ටරය"යනුවෙන් සඳහන් කරනු ලබන) **අක්වෙරළ සමාගම් - කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව** නමින් හඳුන්වනු ලබන රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු අතර, එවැනි සමාගමකට ලියාපදිංචි අංකයක් දෙනු ලැබිය යුතුය.

**5.** 4 වන නියෝගය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව, ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය, කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබුවේ යම් සමාගමක් වෙත ද ඒ සමාගම සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමෙන් නිදහස් කිරීමක් ලෙසට සලකනු ලැබිය යුතුය.

**6.** (1) 4 වන නියෝගය යටතේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමක් -

(*අ*) 2 වන නියෝගය යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයෙහි සපයන ලද තොරතුරුවල යම් වෙනසක් හෝ වෙනස් කිරීමක් සිදු වූ කවර හෝ විටෙක දී ; හෝ

(*ආ*) සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් යම් අවස්ථානුගත තත්ත්වයක්, එනම් :-

(i) වෙනත් සමාගමක් හෝ නෛතික අස්තිත්වයක් සමඟ බද්ධ කිරීමක් හෝ ඒකාබද්ධ කිරීමක් ;

(ii) ව්‍යාපාර කොටස හෝ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අඩුකිරීමක් ;

(iii) සමාගමේ ණය ගෙවිය යුතු වන විටෙක දී ඒ ණය ගෙවීමට නොහැකි වීමක් හෝ ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමක් ;

(iv) සමාගමේ තත්ත්වයේ වෙනස් වීමක් ;

(v) සමාගමේ නාමයේ වෙනස් වීමක් ;

(vi) වත්කම් අත්කර ගැනීමට හෝ අත්කර ගැනීම සඳහා වන ගිවිසුමට පෙර සමාගමේ වත්කම්වල වටිනාකමෙන් අඩකට වඩා වැඩි වටිනාකමක සම්භාව්‍ය හෝ සම්භාව්‍ය නොවන වත්කම් අත්කර ගැනීමක් හෝ අත්කර ගැනීම සඳහා වන ගිවිසුමක් ;

(vii) සමාගමේ සම්භාව්‍ය හෝ සම්භාව්‍ය නොවන වත්කම් සියල්ලම හෝ සමාගමේ වත්කම්වල වටිනාකමෙන් භාගයකට වඩා වැඩි වටිනාකමක වත්කම් බැහැර කිරීමක් හෝ බැහැර කිරීම සඳහා වන ගිවිසුමක් ;

(viii) අයිතිවාසිකම් හෝ සම්බන්ධතා අත්කර ගැනීමට *නැතහොත්* බැඳීම් හෝ වගකීම් දැරීමට පෙර වත්කම්වල වටිනාකමෙන් අඩකට වඩා වැඩි වටිනාකමක අයිතිවාසිකම් හෝ සම්බන්ධතා සමාගම විසින් අත්කර

ගැනීමේ නැතහොත් සමාගම විසින් එවැනි වටිනාකමක බැඳීම් හෝ වගකීම් දැරීමේ බලපෑම ඇති හෝ බලපෑම ඇති වීමට ඉඩ ඇති ගණුදෙනුවක් ;

(ix) සමාගම සංස්ථාගත කරන ලද රට තුළ අදාළ වන නීතිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන අදාළ නියාමන අධිකාරියේ හෝ අධිකාරීවල අනුමතය, කැමැත්ත, අවසරය හෝ එකඟත්වය ලබාගැනීමට ඒ සමාගමට නියම කෙරෙන යම් වෙනත් කාරණයක් ; හෝ

(x) සමාගම සංස්ථාගත කරන ලද රට තුළ අදාළ වන නීතිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන අදාළ නියාමන අධිකාරියට හෝ අධිකාරීවලට දැන්වීමක් භාරදීම කළ යුතු වන යම් වෙනත් කාරණයක්,

සිදු වූ කවර හෝ විටෙක දී,

ඒ සිදුවීමෙන් දින තිහක් ඇතුළත, ඒ පිළිබඳව මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති III වන ආකෘති පත්‍රයට අනුව කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු ය.

(2) (1) වන උපනියෝගය යටතේ කොමිෂන් සභාවට ලැබෙන තොරතුරු, කොමිෂන් සභාව විසින් අප්‍රමාදව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම්දිය යුතුය.

**7.** (1) 6 වන නියෝගය යටතේ දැන්වීමක් ලැබීමෙන් පසුව, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් රෙජිස්ටරයේ තොරතුරු අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු සැලැස්විය යුතුය.

(2) රෙජිස්ටරයේ තොරතුරු යාවත්කාලීන කිරීම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ අක්වෙරළ සමාගම සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන වෙනත් වාර්තාවලට කරනු ලබන යම් වෙනස්කම්වලට අතිරේකව ද ඊට අගති විරහිතව ද විය යුතු ය.

8. 4 වන නියෝගය යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, සිය ව්‍යාපාර කටයුතු ඉදිරියට කරගෙන යාමට අදහස් කරන්නා වූ ද අක්වෙරළ සමාගමක්, පනතේ 41(9) වන වගන්තිය ප්‍රකාරව, 2022 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 2299/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, 2022 අංක 01 දරන බලයලත් තැනැත්තා ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබාදීම (ගාස්තු) නියෝගවල නිශ්චිතව දක්වා ඇති පරිදි වූ වාර්ෂික ගාස්තුව ගෙවීම පිළිබඳව තහවුරු කිරීමක්, මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති IV වන ආකෘති පත්‍රයට අනුව, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

## II වන කොටස

### *ලියාපදිංචිය අවලංගු කිරීම*

**9.** (1) 4 වන නියෝගය යටතේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමක් සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ අක්වෙරළ සමාගම විසින් ඒ පිළිබඳ දැන්වීමක් මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති V වන ආකෘති පත්‍රයට අනුව, කොමිෂන් සභාව වෙත යැවිය යුතුය.

(2) (1) වන උපනියෝගය යටතේ දැන්වීමක් ලැබීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් බලයලත් තැනැත්තකු වශයෙන් ඒ අක්වෙරළ සමාගම වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කර, ඒ අක්වෙරළ සමාගමේ නාමය රෙජිස්ටරයෙන් කපාහැරීම පිණිස ඒ දැන්වීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යොමු කළ යුතුය.

**10.** පනතේ VII වන කොටස යටතේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබූ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්, ඒ සමාගමේ ලියාපදිංචිය අවලංගු කර, එහි නාමය රෙජිස්ටරයෙන් කපාහරිනු ලැබ තිබුණ ද, එකී සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සහ සංස්ථාගත කරන ලද සංස්ථාවක් වශයෙන් අඛණ්ඩව පැවතිය යුතු බවට සැක දුරුකිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

## III වන කොටස

*අර්ථ නිරූපණය*

11. මේ නියෝගවල -

“ කොමිෂන් සභාව” යන්නෙන් පනත යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ; සහ

“සමාගම් පනත” යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත අදහස් වේ.

## උපලේඛනය

(2 වන නියෝගය)

## I වන ආකෘති පත්‍රය

## ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය

*(කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි වීම සඳහා - පනතේ 41(2) වන වගන්තිය)*

| | |
|---|---|
| කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ යොමු අංකය : | |

| | | |
|---|---|---|
| 01 | සමාගමේ නම : | |

| | |
|---|---|
| 02 | විදේශ රටක සංස්ථාගත කරන ලද සමාගමක් වන විටෙක දී - |

| |
|---|
| (අ) සංස්ථාගත කළ රට තුළ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය : |
| |

| |
|---|
| (ආ) ශ්‍රී ලංකාව තුළ සමාගමේ කාර්යාලයේ ලිපිනය (*කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ*) : |
| |

03

| සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ හෝ එකී කටයුතු කළමනාකරණය කරන තැනැත්තන්ගේ විස්තර ලැයිස්තුව : | | | | |
|---|---|---|---|---|
| සම්පූර්ණ නම: | | | | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය :<br>(*නිකුත් කළ රට සඳහන් කරන්න*)<br><br>ජාහැඅ :<br>(*ශ්‍රී ලාංකිකයන් සඳහා*) | | | | |
| ලිපිනය : | | | | |
| රැකියාව : | | | | |
| තනතුරු නාමය : | | | | |

04 සමාගම නියෝජනය කිරීමට බලය පවරා ඇති ශ්‍රී ලංකාවේ පදිංචි සහ ශ්‍රී ලාංකික පුරවැසියන් වන තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ලැයිස්තුව : (*විදේශයක දී සංස්ථාගත කරන ලද සමාගම්වලට පමණක් නියම කරනු ලැබේ.*)

| | | | |
|---|---|---|---|
| සම්පූර්ණ නම: | | | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය : (*නිකුත් කළ රට සඳහන් කරන්න*)<br><br>ජාහැඅ : (*ශ්‍රී ලාංකිකයන් සඳහා*) | | | |
| ලිපිනය : | | | |
| රැකියාව : | | | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ හෝ බලයලත් තැනැත්තාගේ සම්පූර්ණ නම : | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ හෝ බලයලත් තැනැත්තාගේ අත්සන : | |

| | | | |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය : | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
| | | | |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද්දේ : | *නම :* | |
| | *තනතුරු නාමය :* | |
| | *ලිපිනය :* | |
| | *විද්‍යුත් තැපැල :* | |
| | *ස්ථිර දුරකථනය :* | |
| | *ජංගම දුරකථනය :* | |

*සමාගමේ පහත සඳහන් ලේඛන අමුණා ඉදිරිපත් කළ යුතුය :*

(i) සමාගම සංස්ථාපිත කරන හෝ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපණය කරන අධිකාරපත්‍රයේ, ව්‍යවස්ථාවේ, සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ එවැනි වෙනත් සාධන පත්‍රයක සහතික කළ පිටපතක්. (එවැනි යම් ලේඛනයක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නොවන අවස්ථාවක දී, ඒ ලේඛනයේ ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඉදිරිපත් කළ යුතුය.)

(ii) සමාගම විදේශ රටක සංස්ථාගත කර ඇත්නම්, මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පූර්වාසන්න දින තිහ (30)ක් ඇතුළත දී නිකුත් කළ අධිකාරිය විසින් සහතික කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක්.

(iii) සමාගමට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලියාපදිංචි වීමට, ඒ සමාගම සංස්ථාගත කර ඇති රට තුළ කිසිදු නීතිමය බාධාවක් නොමැති බවට ඒ සමාගම විසින් නිසි පිරිදි සත්‍යායනය කොට නිකුත් කරන ලද ප්‍රකාශයක්.

(iv) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව වෙත පිරිසැකසුම් කිරීමේ ගාස්තුවක් ගෙවන ලද බවට තහවුරු කෙරෙන ලදුපතේ පිටපතක්.

**II වන ආකෘති පත්‍රය**

[4(1) වන නියෝගය]

**ලියාපදිංචි කිරීමේ සහතිකය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

| | | |
|---|---|---|
| සමාගමේ අංකය | පීසීසී | |

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

(41 වන වගන්තිය ප්‍රකාර) අක්වෙරළ සමාගමක් ලියාපදිංචි කිරීමේ සහතිකය

..........................................................................................................................................................2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 41 වන වගන්තිය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශය මත, 2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටස ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට, ශ්‍රී ලංකාව තුළ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද බව මෙයින් සහතික කරමි.

*සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්*

## III වන ආකෘති පත්‍රය

[6(1) වන නියෝගය]

### තොරතුරුවල වෙනස්වීම් හෝ වෙනස් කිරීම් දැනුම්දීම

*(කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසරය ඇති අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරුවල වෙනස්වීම් සිදුවීම හෝ වෙනස් කිරීම් සිදු කිරීම- පනතේ 41(4) වන වගන්තිය)*

| | |
|---|---|
| කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ යොමු අංකය ඃ | |

| | | |
|---|---|---|
| 01 | සමාගමේ නම ඃ | |

| | |
|---|---|
| 02 | සමාගම සංස්ථාපිත කරන හෝ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපණය කරන අධිකාරපත්‍රයේ, ව්‍යවස්ථාවේ, සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ වෙනත් සාධන පත්‍රයේ වෙනස් කිරීම් හෝ සංශෝධනය කිරීම් පිළිබඳ වාර්තාව. |

| | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය ඃ | | | |

*(එපරිදි වෙනස් කරන ලද, සමාගම සංස්ථාපිත කරන හෝ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපණය කරන අධිකාරපත්‍රයේ, ව්‍යවස්ථාවේ හෝ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ වෙනත් සාධන පත්‍රයේ සහතික කළ පිටපතක් අමුණන්න. එවැනි යම් ලේඛනයක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නොවන අවස්ථාවක දී, ඒ ලේඛනයේ ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඉදිරිපත් කරන්න.)*

| | |
|---|---|
| 03 | සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ හෝ එහි කටයුතු කළමනාකරණය කරන තැනැත්තන්ගේ විස්තර වෙනස්වීම හෝ වෙනස් කිරීම පිළිබඳ වාර්තාව හෝ ඔවුන්ගේ විස්තර ඃ<br>*(සුදුසු පරිදි* ✓ *ලකුණ යොදා මෙම දැන්වීම භාරදෙන කාර්යය සඳහන් කරන්න.)* |

*(අ)* අධ්‍යක්ෂවරුන් වෙනස්වීම සහ/හෝ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර වෙනස්වීම. ☐

*(ආ)* වෙනත් කළමනාකරණ නිලධරයන් වෙනස්වීම සහ/හෝ එවැනි නිලධරයන්ගේ විස්තර වෙනස්වීම. ☐

තනතුර දැරීම නතරවීම ඃ

| | |
|---|---|
| සම්පූර්ණ නම ඃ | |
| තනතුරු නාමය ඃ | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය ඃ<br>*(නිකුත් කළ රට සඳහන් කරන්න)*<br><br>ජාහැඅ ඃ<br>*(ශ්‍රී ලාංකිකයන් සඳහා)* | |

| | |
|---|---|
| ලිපිනය : | |
| තනතුර දැරීම නතර වූ දිනය :<br>(*වර්ෂය/ මාසය/ දිනය*) : | |
| හේතුව : | |

**නව අධ්‍යක්ෂවරුන් හෝ වෙනත් කළමනාකරණ නිලධරයන් පත්කිරීම :**

| | |
|---|---|
| සම්පූර්ණ නම : | |
| තනතුරු නාමය : | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය :<br>(*නිකුත් කළ රට සඳහන් කරන්න*)<br><br>ජාහැඅ :<br>(*ශ්‍රී ලාංකිකයන් සඳහා*) | |
| ලිපිනය : | |
| සමාගම තුළ ඔවුන් දරන තනතුර | |
| පත්වීම් දිනය<br>(*වර්ෂය/ මාසය/ දිනය*) : | |

දැනට සිටින අධ්‍යක්ෂවරුන්ගේ හෝ වෙනත් කළමනාකරණ නිලධරයන්ගේ විස්තරවල වෙනස්වීම් : *(අදාළ වන තොරතුරු පමණක් පිරවිය යුතුය.)*

| | |
|---|---|
| අලුත් නම : | |
| පෙර නම : | |
| නව විදේශ ගමන් බලපත්‍ර/ජාහැඅ : | |
| නව ලිපිනය : | |
| පෙර ලිපිනය : | |
| නව තනතුරු නාමය : | |
| පෙර තනතුරු නාමය : | |

| | (*වර්ෂය*) | (*මාසය*) | (*දිනය*) |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය : | | | |

04 ශ්‍රී ලංකාවේ සමාගමේ බලයලත් නියෝජිතයන්ගේ විස්තර වෙනස්වීම හෝ වෙනස් කිරීම පිළිබඳ වාර්තාව හෝ ඔවුන්ගේ විස්තර : (*සුදුසු පරිදි* ✓ *ලකුණ යොදා මෙම දැන්වීම භාරදෙන කාර්යය සඳහන් කරන්න.*)

(*අ*) බලයලත් නියෝජිතයන් වෙනස්වීම. ☐

(*ආ*) බලයලත් නියෝජිතයන්ගේ විස්තර වෙනස්වීම ☐

**බලය දැරීම නතරවන බලයලත් නියෝජිතයන් :**

| | |
|---|---|
| සම්පූර්ණ නම : | |
| තනතුරු නාමය : | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය :<br>(*නිකුත් කළ රට සඳහන් කරන්න*)<br><br>ජාහැඅ :<br>(*ශ්‍රී ලාංකිකයන් සඳහා*) | |
| ලිපිනය : | |
| තනතුර දැරීම නතර වන දිනය<br>(*වර්ෂය/ මාසය/ දිනය*) : | |
| හේතුව : | |

**අලුත් බලයලත් තැනැත්තන් පත්කිරීම :**

| | |
|---|---|
| සම්පූර්ණ නම : | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය :<br>(*නිකුත් කළ රට සඳහන් කරන්න*)<br><br>ජාහැඅ :<br>(*ශ්‍රී ලාංකිකයන් සඳහා*) | |
| ලිපිනය : | |
| රැකියාව : | |
| පත්වීම් දිනය : | |

**බලයලත් නියෝජිතයන්ගේ විස්තර වෙනස්වීම : (*අදාළ වන තොරතුරු පමණක් පිරවිය යුතුය.*)**

| | |
|---|---|
| අලුත් නම : | |
| පෙර නම : | |
| නව විදේශ ගමන් බලපත්‍ර/<br>ජාහැඅ : | |
| නව ලිපිනය : | |
| පෙර ලිපිනය : | |
| නව තනතුරු නාමය : | |
| පෙර තනතුරු නාමය : | |

| | (*වර්ෂය*) | (*මාසය*) | (*දිනය*) |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය : | | | |

| | |
|---|---|
| 05 | සමාගම සංස්ථාගත කළ රට තුළ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම වෙනස්වීම හෝ වෙනස් කිරීම පිළිබඳ වාර්තාව ፡ |

| | |
|---|---|
| පෙර ලිපිනය ፡ | |
| නව ලිපිනය ፡ | |

| | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය ፡ | | | |

| | |
|---|---|
| 06 | ශ්‍රී ලංකාව තුළ සමාගමේ කාර්යාලයේ පිහිටීම වෙනස්වීම හෝ වෙනස් කිරීම පිළිබඳ වාර්තාව ፡ (*කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ*) ፡ |

| | |
|---|---|
| පෙර ලිපිනය ፡ | |
| නව ලිපිනය ፡ | |

| | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය ፡ | | | |

| | |
|---|---|
| 07 | මේ නියෝගවල 6 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කාරණා වෙනස්වීම හෝ වෙනස් කිරීම පිළිබඳ වාර්තාව ፡ |

| | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය ፡ | | | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ හෝ බලයලත් නියෝජිතයාගේ සම්පූර්ණ නම | |
| අධ්‍යක්ෂවරයාගේ හෝ බලයලත් නියෝජිතයාගේ අත්සන | |

| | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
|---|---|---|---|
| වෙනස්වීම සිදු වූ දිනය ፡ | | | |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද්දේ ፡ | *නම ፡* | |
| | *තනතුරු නාමය ፡* | |
| | *ලිපිනය ፡* | |
| | *විද්‍යුත් තැපෑල ፡* | |
| | *ස්ථිර දුරකථනය ፡* | |
| | *ජංගම දුරකථනය ፡* | |

**IV වන ආකෘති පත්‍රය**

(8 වන නියෝගය)

**වාර්ෂික ගාස්තුව ගෙවීම පිළිබඳව තහවුරු කිරීම**

| | |
|---|---|
| සමාගම ලියාපදිංචි කිරීමේ අංකය | |

| | |
|---|---|
| සමාගමේ නම : | |

| | |
|---|---|
| වාර්ෂික ගාස්තු : (ඇ.ඩො. වලින්) | |

| | | | | |
|---|---|---|---|---|
| ගෙවීම සිදු කළ ක්‍රමය : | සුදුසු පරිදි ✓ ලකුණ යොදා ගෙවීම සිදු කළ ක්‍රමය සඳහන් කරන්න. | | | ගෙවීම තහවුරු කිරීම (ගෙවීම තහවුරු කරන යොමු අංකය) |
| | මාර්ගගත ක්‍රමය | බැංකු පැවරුමකින් : | ☐ | |
| | | අන්තර්ජාල ගෙවීම් පිවිසුමකින් : | ☐ | |

| | (වර්ෂය) | (මාසය) | (දිනය) |
|---|---|---|---|
| ගෙවීම සිදු කළ දිනය : | | | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ / බලයලත් නියෝජිතයාගේ නම : | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ / බලයලත් නියෝජිතයාගේ අත්සන : | |

| | (වර්ෂය) | (මාසය) | (දිනය) |
|---|---|---|---|
| ගෙවීම සිදු කළ දිනය : | | | |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද්දේ : | *නම :* | |
| | *තනතුරු නාමය :* | |
| | *ලිපිනය :* | |
| | *විද්‍යුත් තැපැල :* | |
| | *ස්ථිර දුරකථනය :* | |
| | *ජංගම දුරකථනය :* | |

**V වන ආකෘති පත්‍රය**

[9(1)වන නියෝගය]

**ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීමට අදහස් කරන බව දැන්වීම**

*(කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ සමාගමක් වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීමට අදහස් කරන බව දැන්වීම - පනතේ 41(10) වන වගන්තිය)*

| | |
|---|---|
| සමාගම ලියාපදිංචි කිරීමේ අංකය | |

| | |
|---|---|
| සමාගමේ නම : | |

| | |
|---|---|
| සංස්ථාගත කළ රට : | |

ඉහත නම් සඳහන් සමාගම, මෙහි පහත සඳහන් දිනයේ සිට ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

| | *(වර්ෂය)* | *(මාසය)* | *(දිනය)* |
|---|---|---|---|
| ව්‍යාපාර කටයුතු නතර කරන දිනය : | | | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ / බලයලත් නියෝජිතයාගේ නම : | |

| | |
|---|---|
| අධ්‍යක්ෂවරයාගේ / බලයලත් නියෝජිතයාගේ අත්සන : | |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද්දේ : | *නම :* | |
| | *තනතුරු නාමය :* | |
| | *ලිපිනය :* | |
| | *විද්‍යුත් තැපෑල :* | |
| | *ස්ථිර දුරකථනය :* | |
| | *ජංගම දුරකථනය :* | |

EOG 11-0185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.